# රටේ ස්වෛරීභාවය

බටහිරයන් විසින් ඇතිකරනු ලැබ ඉන්දියාව හා බටහිරයන් විසින් විවිධ හේතු නිසා පෝෂණය කරනු ලැබූ කොටි සංවිධානය පරාජය කිරීමට මේ ආණ්ඩුව කටයුතු කෙළේ රටේ ස්වෛරීභාවය රැකගැනීමට ය. රණවිරුවන්ගේ ජීවිත පූජාවෙන් අප රැකගත්තේ මෙරට ස්වෛරීභාවය ය. ඔවුන් දසදහස් දෙනා ජීවිත පූජා කෙළේ රටේ ස්වෛරීභාවය රැකගැනීමට ය. ඒ සඳහා ඔවුන්ට සටන් කිරීමට සිදු වූයේ ලොවේ දරුණුතම හා කෲරතම වූ ද, බටහිර රටවල පිහිටෙන් ඉතාමත් නවීන ආයුධ රැස්කරගත්තා වූ ද ත්‍රස්තවාදී සංවිධානයක් වූ කොටි සංවිධානය සමග ය. බටහිරයන් දැන් අපට තර්ජනය කරන්නේ එසේ ජීවිත පූජාවෙන් රැකගත් ස්වෛරීභාවය පාවා දීමට ය.

බටහිරයන්ට අවශ්‍ය මෙරට ඊළමක් පිහිටුවීමට ය. ඔවුහු සිංහලයන්ට විරුද්ධව ක්‍රියාකරති. ඊශ්‍රායලය බිහිකිරීමට පෙර බටහිරයන් අප රටේ යුදෙව්වන් පදිංචි කිරීමට සැලසුම් කර ඇත. එහෙත් ඔවුන් ඒ අදහස අත්හැරියේ ලංකාව බටහිර රටවලින් ඈත පිහිටි බැවින් ය. පසුව ඔවුහු ඒ සඳහා පලස්තීනය තෝරාගත්හ. යම් අයුරකින් බටහිරයන්ට යුදෙව්වන් ලංකාවේ පදිංචි කිරීමට හැකි වුණි නම් අද ලංකාවේ තත්වය සිතාගත හැකි ය. අවුරුදු තිහකින් අපට කොටි පරාජය කිරීමට හැකිවුවත් යුදෙව්වන්ගේ සියොන්වාදය පැරදවීමට අපට අවුරුදු කීයක් ගතවීමට තිබුණි ද යන්න කිව නො හැකි ය.

අප කිහිප වතාවක් ම කියා ඇති පරිදි බටහිර දෙබිඩි ප්‍රතිපත්තියක් නැත. ඇත්තේ එකම එක ප්‍රතිපත්තියක් පමණකි. ඒ බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යටත්විජිත සංරචක ලෝ පුරා තහවුරු කිරීම ය. වත්මන් බටහිරයන් තරම් ත්‍රස්තවාදීන් පිරිසක් මෙලොව කිසි දිනෙක ජීවත් වී නැතැයි කිවහැකි ය. අද ඔවුන් තම සංස්කෘතික හා දේශපාලන යටත්විජිතවාදය කෙතරම් ලොව පුරා ව්‍යාප්ත කර ඇත්ද යන්න ලොවෙහි අධ්‍යාපනය ගැන අධ්‍යයනයක් කිරීමෙන් දත හැකි ය. ඔවුහු ත්‍රස්තවාදී ව ලෝකයේ අනෙක් දැනුම් පද්ධතීන්ට කිසිම ඉඩක් නො දෙති. අපට අපේ දැනුමක් පාසලක හෝ විශ්වවිද්‍යාලයක හෝ ඉගැන්වීමට අවසරයක් නැත. අප උගන්වන්නේ ඔවුන්ගේ දැනුම ය. සිංහල සාහිත්‍යය ඉගැන්වුවත් බෞද්ධ දර්ශනය ඉගැන්වුවත් අපට උගන්වන්නට සිදු වී ඇත්තේ ඔවුන්ගේ ක්‍රමයට ය. අපට බටහිර සාහිත්‍ය විචාර ක්‍රම හඳුන්වා දී අප කොටු කෙළේත් බටහිරයන්ගේ තෘප්තිය සඳහා චතුස්කෝටිකය ද්විකෝටිකයක් බවට පත්කිරීමට උත්සාහ කෙළේත් ලන්ඩන් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවල ඉගෙන පසුව මෙරට මහාචාර්ය පදවිවලට පත්වූවන් ය. කේම්බ්‍රිජ් ඔක්ස්ෆර්ඩ් ලන්ඩන් හා අනෙක් ඉංගිරිසි විශ්වවිද්‍යාල එක් අතෙකින් ත්‍රස්තවාදී මධ්‍යස්ථාන ලෙස හැඳින්විය හැකි ය. මේ කියමනට මෙරට බොහෝ උගතුන් යැයි කියන්නන්, එනම් ලංකා විශ්වවිද්‍යාලය ඇතුළු බටහිර විශ්වවිද්‍යාලවලින් හා වෙනත් එවැනි ආයතනවලින් සහතිකපත් ලද්දවුන්, එකහෙළා ම විරුද්ධ වන බව මම දනිමි. ලංකා විශ්වවිද්‍යාලයෙන් කිසිවක් ඉගෙන නොගත් එහෙත් විභාගයකින් සාමාර්ථයක් ලත් මට උපාධි ප්‍රදානෝත්සවයේ දී ලැබෙන සහතිකය නැත්තේ අභිමුඛයේ හෝ අනභිමුඛයේ හෝ මා ඒ සහතිකය ලබාගෙන නොමැති බැවිනි. කළු ලෝගු ඇඳ රතු ලෝගු ඇඳි ඇඳුරන් ඉදිරියෙන් පෙරහැරේ යන උපාධිලාභීන් මට පෙනෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ලෝගුවෙන් තම ආධ්‍යාත්මය සිරකරගෙන පෙරෙට්ටුවට යන සිරකරුවන් පිරිසක් ලෙස ය. අපේ ඇතැම් නායක හාමුදුරුවරුන් ලවා ද මොවුන්ට මල්මාලා පළඳවා සහතික දීමට සලස්වා තිබීම ගැන අප තව සිතා බැලිය යුතු ය. බන්ධනාගාරගත පුද්ගලයන්ට ලැබෙන ජම්පරය නමැති ඇඳුම හා උපාධි ලෝගුව අතර ඇති වෙනස ශාරීරික හා ආධ්‍යාත්මික වෙනසකි. කොටසක් කොටුකළ බන්ධනාගාරවල ශාරීරකව සිරකෙරී ඇත. අනෙක් කොටස එළිමහන් බන්ධනාගාරවල ආධ්‍යාත්මික ව සිරකෙරී ඇත.

බටහිරයෝ අද ඊනියා මානව හිමිකම් ගැන කතාකරති. අපට ජී එස් පී බදු සහනය නොදෙන්නේත්  බෑන් කි මූන් නමැති පඹයා ඇමරිකාවේ හා එංගලන්තයේ (ඊනියා උගතුන්ට අනුව මහා බ්‍රිතාන්‍යයේ හෝ එක්සත් රාජධානියේ හෝ) අවශ්‍යතාවට අඩුම තරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ මධ්‍යස්ථානයේ ආරක්ෂක මණ්ඩලයේ අනුමතියවත් නොමැතිව ලංකාවේ මානව හිමිකම් ගැන වාර්තාකිරීමට, එනම් මෙරට සිටින රාජ්‍ය නොවන සංවිධානවල බැළයන් ලියන කියන දෙය ලේකම් ජෙනරාල්ට පැවසීමට, ත්‍රිපුද්ගල මණ්ඩලයක් පත්කර ඇත්තේත් හැකිනම් සිංහලයන්ගේ ආත්මශක්තිය දුර්වල කර රටේ ස්වෛරීභාවය නැතිකිරීමට ය. අප ගිය සතියේ කී පරිදි ලංකාවට විරුද්ධව ආර්ථික සම්බාධක පනවා අප හාමතේ තබා හෙම්බත්කර ස්වෛරීභාවය

© Prof. Nalin De Silva

පැහැර ගැනීම මේ ත්‍රස්තවාදීන්ගේ උපාය වී ඇත. මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ මහතුන් හා ශවේන්ද්‍ර සිල්වා මහතා ඇතුළු හමුදා නිලධාරීන් දංගෙඩියට යවා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව වට්ටවා ඒ ජා ප ආන්ඩුවක් පිහිටුවීමට කටයුතු කිරීම බටහිරයන්ගේ අභිලාෂය වෙයි. එහි දී ඔවුහ සරත් ෆොන්සේකා සහ ඔහුගේ සුදු කොඩි යොදාගන්නේ හිටපු ජෙනරාල් තවත් අවුං සාන් සුකී කෙනකු බවට පත්කිරීමට කටයුතු කරමිනි.

මෙහි දී ඒ ජා ප හා ජ වි පෙ ක්‍රියාකරන්නේ බටහිරට අවශ්‍ය ආකාරයට ය. ඒ ජා ප නායකත්වය කවදත් බටහිරයන්ගේ නියෝජිතයෝ වූහ. ඒ පිළිබඳ විස්තරයක් අවශ්‍ය නො වේ. ජ වි පෙ ද අවුරුදු කිහිපයක සිට ක්‍රියා කරන්නේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයට ය. ඒ පක්ෂයෙහි කලක සිට පැහැදිලිව ම ඇමරිකානු ධාරාවක් ක්‍රියාත්මක විය. අද ඒ ධාරව පක්ෂයෙහි නායකත්වය අතට ගෙන ඇත. අනුර කුමාර දිසානායක පසුගියදා කියා සිටියේ බෑන් කි මූන් ගේ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට සරත් ෆොන්සේකා යැවිය යුතු බව ය. ජ වි පෙට අනුව ලංකාවෙන් බටහිරයන්ගේ චෝදනාවලට සාර්ථක ව මුහුණ දිය හැක්කේ සරත් ෆොන්සේකාට ය. අනුර කුමාර දිසානායක හෙවත් එකල අරවින් ද යෝජනා කරන්නේ හොරාගෙ අම්මගෙන් පේන ඇසීමට නොව හොරාගෙන් පේන ඇසීමටය. බෑන් කි මූන්ට මානව හිමිකම් මණ්ඩල පත්කිරීමට ඉඩ ලැබුණේ ප්‍රධාන වශයෙන් ම සරත් ෆොන්සේකා නිසා ය. එකී ෆොන්සේකා ම මණ්ඩලය ඉදිරියට යැවීමට කරන යෝජනාවේ යටි අරමුණ කුමක් ද යන්න පැහැදිලි ය.

ජාතික හෙළ උරුමය හා ජාතික නිදහස් පෙරමුණ මේ වන විටත් එක්සත් ජාතීන්ගේ සංවිධානයට එරෙහි ව විරෝධතා ව්‍යාපාරවල යෙදී ඇත. බෑන් කි මූන් ඊනියා මානව හිමිකම් මණ්ඩලය අස්කර ගන්නා තෙක් අඛණ්ඩ උපවාසයක යෙදීමට ජා නි පෙ තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් ඒ පක්ෂයට මෙරට විජාතිකයන්ගේ හා විජාතික බලවේගවල විරෝධතාව පළ වී ඇත. රනිල් වික්‍රමසිංහ ඇතුළු විජාතික බලවේගවලට අනුව ආණ්ඩුවේ ඇමතිවරයකු වූ විමල් වීරවංශ මහතා ක්‍රියාකර ඇති ආකාරය නිවැරදි නො වේ. වීරවංශ මහතා මගේ ප්‍රියතම දේශපාලනඥයා නො වේ. එහෙත් මම ඒ මහතා ක්‍රියාකර ඇති ආකාරයෙහි වරදක් නුදුටිමි. මෙරට විජාතික පංතියට ඉංගිරිසින් උගන්වා ගොස් ඇති බොරු සදාචාර පද්ධතියක් වෙයි. මේ සදචාර පද්ධතියට අනුව ඇමතිවරුන්ට උද්ඝෝෂණ තහනම් ය. එහෙත් ගැමුණු කුමරු අපට උගන්වා ඇති සදාචාරය එයට වෙනස් ය. රටේ ස්වෛරීභාවයට තර්ජනයක් එල්ල වන විට අත පය අකුළා ගෙන සිටීම සිංහලයන්ගේ සදාචාරය නො වේ.

ලෝකය කුඩා වී ඇති බවත් මානව හිමිකම් ආරක්ෂා කිරීම හමුවේ රටවල ස්වෛරීභාවය අඩු වී (පළුදු වී) ඇති බවත් ඉංගිරිසින්ගෙන් නීතිය හා දේශපාලන විද්‍යාව ඉගෙන ගත්තෝ අපට කියා දෙති. ස්වෛරීභාවය සමමිතික විය යුතු යැයි අපි කියා සිටිමු. ඇමරිකාවට හෝ එංගලන්තයට හෝ ලංකාව සම්බන්ධයෙන් කළ හැකි දෙයක් ලංකාවට ද ඒ රටවල් සම්බන්ධයෙන් කළ හැකි විය යුතු ය. ඇමරිකාවේ හෝ එංගලන්තයේ හෝ බෞද්ධයන්ගේ, මුස්ලිමුන්ගේ මානව අයිතිවාසිකම් කැඩීමට විරුද්ධව යැයි කියමින් ලංකාවට කළ හැක්කේ කුමක් ද? ඇෆ්ගනිස්ථානයේ ඉරාකයේ පලස්තීනයේ සිදුවීම් පිලිබඳ ව අපට කොමිසම් පත්කළ හැකි ද? බටහිරයන් සිතන්නේ ලෝකය ශිෂ්ටකිරීමේ බර දෙවියන් වහන්සේ ඔවුන්ට පටවා ඇති බව ය. අපට කීමට ඇත්තේ දෙවියන් වහන්සේ ඔවුන් ඒ ඊනියා බරින් නිදහස් කිරීම පිළිබඳ අපේ අමනාපයක් නැති බව ය. ඇමරිකාවට අවශ්‍ය අන්දමට සටන්කර ත්‍රස්තවාදය පරාජය කළ හැකි නො වේ. අමෙරිකාව ඉල්ලා සිටින ආකාරයෙන් සටන් කළහොත් කිසිම රටකට කිසිම දිනෙක ත්‍රස්තවාදය පරාජය කළ හැකි නො වේ. අනෙක් අතට ඇමරිකාව ඒ ආකාරයෙන් ඇෆ්ගනිස්තානයේ දී හෝ ඉරාකයේ දී හෝ ක්‍රියා නො කරයි.

අපි අපේ ආහාර නිපදවාගැනීම පිළිබඳ පසුගිය සතියේ කෙටියෙන් සඳහන් කෙළෙමු. මෙය තවදුරටත් පසුව සාකච්ඡා කළ යුතු ය. යුරෝපා සංගමය ජී එස් පී බදුසහනය ඉවත්කර ඇත. අපට හැකි ප්‍රමාණයෙන් අප යුරෝපා සංගමයේ රටවලට රිදවිය යුතු ය. ඒ අතර ජාතිකත්වය වර්ධනය වන ආකාරයෙන් වැඩකළ යුතු ය. මෙරට ඊනියා බුද්ධිමතුනට නොතේරුණ ද ඔවුන් එවැනි දේට සිනහසුණ ද අප යුරෝපා සංගමයේ රටවල නිෂ්පාදන වර්ජනය කිරීම ගැන සිතා බැලි ය යුතු ය. යුරෝපා සංගමයට එය එතරම් තර්ජනයක් නොවුවත් අපේ ජාතිකත්වය වර්ධනය කිරීමෙහි ලා එවැනි ක්‍රියාකාරකම් වැදගත් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva